# ශ්‍රී ලංකාවට අනන්‍ය වූ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ විමර්ශනයක්

පුෂ්පා ඒකනායක[1]

ප්‍රතිකාර ක්‍රමයක් යනු අසනීප ලෙඩ රෝග සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන අදහස් හා ක්‍රියාමාර්ග සමුදයකි. වෛද්‍ය ක්‍රමයක් යනු සෞඛ්‍යාභිවර්ධනය පිණිස වූ චර්යාවෙන් සමන්විත වූ සමාජ සංස්ථා හා සංස්කෘතික සම්ප්‍රදයන්හි රටාවකි. ඒ අනුව ලෙඩ රෝග සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට විවිධ රටවල විවිධ වෛද්‍ය පද්ධති, ප්‍රතිකාර ක්‍රම පැවැතිය හැකිය. යම් රටක භාවිතා වන වෛද්‍ය පද්ධති, ප්‍රතිකාර ක්‍රම හා සෞඛ්‍ය සිරිත් විරිත් එරට ඉතිහාසයෙහි ඵලයක් වන අතර එය එක්තරා පාරිසරික හා සංස්කෘතික රාමුවක් තුළ උපන් හා දියුණු වූ දෙයකි. ඒ අනුව යම් රටක දේශීය වෛද්‍ය ක්‍රමය වශයෙන් සලකනු ලබන්නේ එහි ම උපන් හා වැඩි දියුණු වූ ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය වශයෙන් නීත්‍යානුකූලව හඳුන්වා දෙනු ලබන්නේ ආයුර්වේදයයි.

ආයුර්වේදයේ නිජබිම ඉන්දියාව බව සැළකේ. පාරම්පරික දේශීය චිකිත්සාව නොහොත් සිංහල වෙදකම ශ්‍රී ලංකාවේ ප්‍රභවය වී විකාසනය වුවක් බව ද සැළකේ. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය වශයෙන් සැලකීමේ දී මෙකී ක්‍රම දෙක එකිනෙකින් වෙන් කර හඳුනාගත නොහැකි වන තරමට බද්ධ වී ක්‍රියාත්මක වන බවක් ද හඳුනාගත හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවට අනන්‍ය වූ දේශීය වෛද්‍ය ක්‍රමය ආයුර්වේදය ද එසේ නොමැති නම් පාරම්පරික දේශීය චිකිත්සාව ද යන්න පැහැදිලි නිගමනයකට පැමිණ නොමැති ගැටලුවකි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ඒ පිළිබඳව දැනට පවතින මත විමර්ශනයට ලක් කරමින් ශ්‍රී ලංකාවට අනන්‍ය දේශීය වෛද්‍ය ක්‍රමය කුමක්ද යන්න හඳුනා ගැනීමයි.

අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමට ක්‍රමවේද කිහිපයක් භාවිතා කරන ලදී. ලිඛිත මූලාශ්‍ර භාවිතා කිරීම, අධ්‍යයන නියැදියකින් තොරතුරු ලබා ගැනීම හා පුරාවිද්‍යාඥයින්ගේ මත විමසා බැලීම තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේද වශයෙන් භාවිතා විය. ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳව අදහස් දක්වා ඇති විවිධ ලේඛකයින් විසින් ලියන ලද ලිපි ලේඛන ලිඛිත මුලාශ්‍ර වශයෙන් භාවිතා කරන ලද අතර අධ්‍යයන නියැදියට අයත් ආයුර්වේද හා දේශීය වෛද්‍යවරුන් තිස් දෙනෙකුගෙන් ලබා ගන්නා ලද ප්‍රාථමික දත්ත ද භාවිතයට ගැනුණි. තව ද මේ පිළිබඳව ඓතිහාසික කරුණු විමසා බැලීම සඳහා පුරාවිද්‍යාඥයින්ගේ අදහස් ද උපයෝගී කරගනු ලැබිය.

ශ්‍රී ලංකාවට අනන්‍ය දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳව පවතින ප්‍රධාන මත දෙකක් හඳුනාගත හැකි විය. එක් මතයක් නම් ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය වන්නේ ඉන්දියාවෙන් පැමිණි ආයුර්වේදය බවයි. අනෙක් මතය වන්නේ ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය වන්නේ ශ්‍රී ලාංකික මිනිස් ඉතිහාසයේ ආරම්භයේ පටන් පැවැත එන සිංහල වෙදකම නොහොත් පාරම්පරික දේශීය චිකිත්සාව බවයි. මේ එක් එක් මතයන් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු විමර්ශනය කිරීමේ දී පැමිණිය හැකි එක් ප්‍රධාන නිගමනයක් වන්නේ දේශීය වෛද්‍ය ක්‍රමයේ අනන්‍යතාව පිළිබඳ

1 සමාජවිද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය
ranjani@soci.ruh.ac.lk

සිය මතය ගොඩනගාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව ඔවුන් දරන ස්ථාවරත්වයට ගැලපී යන ආකාරයටයි.තව ද ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාඥයින් වසර ලක්ෂ ගණනාවක් ඈතට දිවෙන මිනිස් ඉතිහාසයක් සොයා ගනු ලැබුවා වුව ද, සෞඛ්‍ය හා රෝග සම්බන්ධ එම ආදි මානවයන්ගේ හැසිරීම පිළිබඳ පුරා විද්‍යාත්මක සාධක මෙතෙක් තහවුරු කරගෙන නොමැත. එය තවදුරටත් පර්යේෂණ කළ යුතු ක්ෂේත්‍රයක්ව පවතී. ආයුර්වේදය යනු කලාපීය වෛද්‍ය පද්ධතියකි. ශ්‍රී ලංකාවේ පැවැති පාරම්පරික ප්‍රතිකාර ක්‍රමය සමග ඉන්දීය ආයුර්වේදය ඉතා හොඳින් සම්මිශ්‍රණය වී වර්තමාන ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය පද්ධතිය සකස් වී ඇති බව නිගමනය කළ හැකි වේ.

**ප්‍රමුඛ පද :** දේශීය වෛද්‍ය ක්‍රමය, ආයුර්වේදය, සිංහල වෙදකම